**රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - 2021**

**---------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවාදැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1හි 69 ඡේදය ප්‍රකාරව, 2021 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.මිලියන 23.01 ක් වූ විශේෂිත අරමුණු 03 ක් වෙනුවෙන් ස්ථාපිත අරමුදල් ගිණුම් 03 ක් ජංගම නොවන වගකීම් ලෙස හෙළිදරව් කරනු වෙනුවට ජංගම වගකීම් ලෙස හෙළිදරව් කර තිබුණි. | අරමුදල් ගිණුම් 03 ම විශේෂිත අරමුණු වෙනුවෙන් ලැබී ඇති ප්‍රදානවලින් සමන්විත බැවින් සුදුසු කටයුත්තක් සඳහා යොදා ගන්නා තුරු මුදල් වෙන්කර තැබිය යුතු බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2හි 36 (අ) ඡේදය ප්‍රකාරව භාවිතා කළ පිරිවැය සූත්‍රයද ඇතුළුව තොග මැනීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවද, ඔසුසැල්වල ඉතිරි තොග සම්බන්ධයෙන් එම හෙළිදරව්කිරීම් සිදු කර නොතිබුණි. | ඔසුසැල්වල අවසාන තොගය ගණනය කර ඇති ආකාරය 2022 ගිණුම් ප්‍රකාශනයේ හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 128.82ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි.ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වත්කම් යළි ප්‍රත්‍යාගණනය කිරීම සඳහා 2020 හා 2021 වසර වලදී උත්සාහ ගත් නමුත් පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් එම කෘත්‍යය ඉටුකර ගත නොහැකි වූ බව හා 2022 වර්ෂය තුළදී එම වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වර්ෂයකට වඩා වැඩි කාලයක් නිරාකරණය නොවන තොගවල සම්පූර්ණ වටිනාකමට සමාන වෙන්කිරීමක් සිදු කිරීමේ ප්‍රතිපත්තිය අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 28.50 ක් වෙන්කර තිබුණු නමුත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 හි 84 ඡේදය ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | ප්‍රතිපාදන වෙන්කිරීම් පිළිබඳ ගණකාධිකරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනයේ 2.8 හා 3.9 යන සටහන්වල දක්වා ඇති බව, වර්ෂයකට වඩා වැඩි කාලයක් නිරාකරණය නොවී පවතින සියලු තොග වටිනාකම් සඳහාත් වර්ෂයකට වඩා අඩු නමුත් පැහැදිලිව නැවත රජයේ බෙහෙත් ගබඩාවට ලබාදිය නොහැකි බව තහවුරු වන තොග සඳහාත් සියයට සියයක වෙන් කිරීමක් සිදුකරන බව. | -එම- |

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ඔසුසැල්හි ඉතිරි තොගවල පිරිවැය හා එම තොගවල හුවමාරු වටිනාකම අතර වෙනස හඳුනාගෙන එය නොඉපයූ ලාභ ලෙස ගැලපිය යුතු වුවද, ඉතිරි තොගවල පිරිවැය නිශ්චිතව හඳුනානොගෙන තොග හුවමාරු වටිනාකමින් සියයට 7.8 කට සමාන රු.මිලියන 58.00 ක් පමණක් නොඉපයූ ලාභ ලෙස වෙන්කර තිබුණි. | ප්‍රධාන ගබඩාවෙන් ඔසුසැල් වලට මාරුකල ආනයනික ඖෂධවලින් වසර අවසානයේ ඉතිරිව ඇති තොගයේ හුවමාරු වටිනාකම නිවැරදිව ගණනය කිරීම සඳහා නිර්මිත වූ පරිගනක පද්ධතියක් සංස්ථාව සතුව නොමැති බව, ඔසුසැල් සාමාන්‍ය තොගයෙන් හුවමාරු ප්‍රතිශතය ඉවත්කර ලබාගත් ඇස්තමේන්තුගත ක්‍රමවේදයකට වසර අවසානයේ ඉතිරිව ඇති තොගයේ හුවමාරු වටිනාකම ගණනය කරන බව හා ඉහත ගණනය කිරීම් සඳහා පවත්නා පරිගණක පද්ධතියේ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට මේ වනවිට කටයුතු කරමින් සිටින බව. | ඔසුසැල්හි ඉතිරි තොගවල පිරිවැය හා එම තොගවල හුවමාරු වටිනාකම අතර වෙනස හඳුනාගෙන එය නොඉපයූ ලාභ ලෙස ගැලපිය යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.372,590 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී සැපයුම්කරුවන් 02 දෙනෙකුගෙන් මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු වෛද්‍ය සැපයීම් වෙනුවෙන් භාණ්ඩ ලැබීම් පත්‍ර සමඟ ඉන්වොයිස් සංස්ථාව වෙත ලබාගෙන නොතිබීම හේතුවෙන් විගණිත දිනය වූ 2022ජුනි 15 දින වන විටත් ගිණුම්ගතවී නොතිබුණු ගැනුම් හා විකුණුම් වටිනාකම රු.මිලියන 4.84 ක්වූ | මෙම වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් සිටින බව. | ගැණුම් හා විකුණුම් වටිනාකම් සහ සේවා ගාස්තු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර ඒ හේතුවෙන් ඊට අදාළ සේවා ගාස්තු ආදායම රු.193,764 ක් ගිණුම් ගත කර නොතිබුණි. | | |
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් සැපයුම්කරුවන් වෙත නිකුත්කර තිබුණු ප්‍රධාන ඇනවුම ප්‍රමාදවීම හේතුවෙන් දේශීය වෙළඳපලින් මිලදී ගැනීමට සිදුවී තිබුණු වෛද්‍ය සැපයීම් සඳහා වැයකිරීමට සිදුවී තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 122.15 ක් අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතුව පවතින බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. තවද එම කාලපරිච්ඡේදය තුළදී එම කාරණය සම්බන්ධයෙන් ශල්‍ය අංශය විසින් වැයකර තිබුණු අතිරේක පිරිවැය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 5.3 යටතේ හෙළිදරව් කර ඇති බව. | අතිරේක පිරිවැය හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට සමස්ථ ණයගැතියන්ගෙන් සියයට 95.6 ක් හෙවත් රු.මිලියන 52,850.87 ක් වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතුව තිබුණු නමුත්, ඖෂධ නිෂ්පාදන, සැපයුම් හා නියාමන අමාත්‍යාංශයේ ගිණුම්වලට අනුව එදිනට එම ශේෂය රු.මිලියන 25,514.28 ක් වූ අතර එම රාජ්‍ය අමාත්‍යාංශය විසින් එවා තිබුණු ශේෂ තහවුරුවට අනුව එම ශේෂය රු.මිලියන 47,166.18 ක් විය. වෙනස පිළිවෙලින් රු.මිලියන 27,336.59 ක් හා රු.මිලියන 5,684.69 ක් සඳහා හේතු ඉදිරිපත් නොකෙරුණි. | මේ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් වෛද්‍ය සැපයුම් අංශයෙන් ඉල්ලා ඇති බව හා එය ලැබුණු වහාම සැසඳීම් සිදු කරන බව. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර මෙවැනි වෙනස්කම් පිළිබඳව සැසඳීම් සිදුකර අවශ්‍ය ගැලපීම් සිදු කළයුතුය. |
| (ආ) | ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කර තිබුණු වෙළඳ ණයහිමියන් 06 දෙනෙකුගේ 2021 දෙසැම්බර් 31 දිනට ගිණුම්වලට අනුව ශේෂය රු.මිලියන 47.40 ක් හා තහවුරු කර තිබුණු ශේෂය රු.මිලියන 158.25 ක් වූයෙන් ඒ අතර රු.මිලියන 110.85 ක ශුද්ධ වෙනසක් පැවතුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ සැසඳුම් පිළියෙල කර වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන වලට අනුව 1996 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී ඔසුසැල් මඟින් අලෙවි කිරීම සඳහා මිලදී ගෙන තිබුණු වෛද්‍ය සැපයීම් වලින් 2021 දෙසැම්බර් 31 දිනට තත්ත්වයෙන් අසමත්, කල් ඉකුත්වූ හා හානිවී තිබුණු වෛද්‍ය සැපයීම්වල පිරිවැය රු.මිලියන 215.48 ක් වුවද, එදිනට භෞතික තොග සමීක්ෂණ වාර්තාව අනුව එහි පිරිවැය රු.මිලියන 195.25ක් පමණක් වූයෙන් වෙනස රු.මිලියන 20.23 ක් විය. වෙනසට හේතුව තොග ඌනතාවයක් බව හඳුනාගෙන තිබුණු නමුත් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | මෙම වෙනස 2013 වර්ෂයේදී හඳුනාගෙන ඇති බව, වෙනස ඇතිවීමට හේතුවූ කාරණය සම්බන්ධයෙන් නිලධාරින් තිදෙනෙකුට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කර විධිමත් විනය පරීක්ෂණ පැවැත්වූ බව, විධිමත් විනය පරික්ෂණ වාර්තා පදනම් කර ගෙන සංස්ථා විනය බලධාරියා විසින් දැනට විශ්‍රාම ගෙන ඇති නිලධාරිනියන් දෙදෙනාගේ රඳවා ගෙන තිබුණු පාරිතෝෂික මුදල හා අනෙකුත් දීමනා නිදහස් කිරීමට කටයුතුකර ඇති බව, දැනට සේවයේ යෙදී සිටින අනෙක් චූදිත නිලධාරියා විධිමත් විනය පරික්ෂණ වාර්තාවට අනුව සියලු චෝදනාවලින් නිදහස් වී ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් විධිමත් පරිදි සිදුකළ යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව ,2021 දෙසැම්බර් 31 දිනට පරිගණක, උපකරණ, ලී බඩු සහ සවිකිරීම් යන ස්ථාවර වත්කම්වල පොත් අගය රු.මිලියන 269.71 ක් වූ නමුත් ස්ථාවර වත්කම් ලේඛනයට අනුව එදිනට එම අගය රු.මිලියන 263.54 ක් පමණක් වූයෙන් වෙනස රු.මිලියන 6.17 ක් විය. වෙනසට නිශ්චිත හේතු ඉදිරිපත් නොකෙරුණි. | ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටින බව. | වෙනස්කම් වලට නිශ්චිත හේතු සහ නිවැරදි කිරීම් පිළිබඳව තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ මුළු විකුණුම් ආදායම රු.මිලියන 79,490.40 ක් වුවද, අලෙවි අංශය විසින් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන වාර්තාවලට අනුව එම අගය රු.මිලියන 78,284.92 ක් වූයෙන් වෙනස රු.මිලියන 205.48 ක් විය. වෙනසට හේතු ඉදිරිපත් නොකෙරුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | -එම- |

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2007, 2008, 2009 හා 2012 වර්ෂවලට අයත් නිරාකරණය නොවූ මාර්ගස්ථ තොග වල (Disputed Goods in Transit) පිරිවැය රු.මිලියන 2.00 ක් හා රේගු ගාස්තු රු.මිලියන 12.60 ක් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැරණි නිරාකරණය නොවූ වටිනාකම් කපා හැරීමට කටයුතු කරන බව. | අයවිය යුතු මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ විධිමත් ලෙස කපාහැරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට බහාලුම් තැන්පතු රු.මිලියන 18.62 ක් වූ අතර ඉන් රු.මිලියන 6.97ක් වර්ෂ 02 ත් වර්ෂ 14ත් අතර කාලයක සිට ආපසු අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. මේ අතරින් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලසීමාවට අදාළ රු.මිලියන 5.74 ක් වූ තැන්පතුවලින් 2021 වර්ෂය තුළදී කිසිඳු මුදලක් ආපසු අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | වර්ෂ 02 ත් වර්ෂ 14 ත් අතර කාලයට අයත් ශේෂයෙන් රු.මිලියන 5.76 ක් කපාහැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇති බව හා ඉතිරි වටිනාකම් සැපයුම්කරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | -එම- |
| (ඇ) | සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව විකුණූ දින සිට දින 30 ත් දින 45 ත් අතර කාලය තුළදී විකුණුම් වටිනාකම් අදාළ වෙළඳ ණයගැතියන්ගෙන් අයකර ගත යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,311.82 ක් වූ වෙළඳ ණයගැති ශේෂය තුළ පෞද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු රු.මිලියන 22.38 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට හා රු.මිලියන 26.87 ක් වර්ෂ 01 ත් වර්ෂ 05 ත් අතර කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. වර්ෂ 05 කට වඩා පැරණි රු.මිලියන 10.44 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා පමණක් නීතිමය පියවර ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 2.37 ක් පිළිබඳව පමණක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි. | වර්ෂ 05කට වැඩි ණයගැතියන්ගේ අගය වන රු.මිලියන 22.38 ක ශේෂය එසේම පවතින බව, වර්ෂ 01ත් 05ත් අතර රු.මිලියන 74.69 න් මේ වන විට රු.මිලියන 47.81 ක් අය කර ගෙන ඇති බව හා ඉතිරි මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව ණය අය කර ගතයුතු කාලසීමාව තුළ හා ගිවිසුම් ප්‍රකාරව ණය අයකරගැනීම කාර්යක්ෂම කළ යුතුය. |
| (ඈ) | 2021දෙසැම්බර් 31 දිනට වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු රු.මිලියන 52,850.87 කින් රු.මිලියන 211.59 ක් වර්ෂ 12 ත් වර්ෂ 23ත් අතර හා රු.මිලියන 3,585.36 ක් | රජයේ වෛද්‍ය සැපයුම් අංශයට භාණ්ඩ භාරදෙන අවස්ථාවේදී ඒවා භාරගෙන ලේඛන ගත කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් නොතිබීම නිසා මෙම | පැරණි ණය ශේෂ පියවා ගැනීමට හෝ විධිමත් ලෙස කපාහැරීමට හෝ |

| | | | |
|---|---|---|---|
| | වර්ෂ 6 ත් වර්ෂ 14 ත් අතර කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | තත්ත්වය ඇතිවීමට ප්‍රධාන හේතුවක් වී ඇති බව, මෙම පැරණි ණය ශේෂ කපාහැරීම සඳහා කටයුතු කරමින් පවතින බව හා පැරණි ශේෂ අය කර ගැනීම සඳහා ශේෂ සැසඳීම් සිදුකරමින් පවතින බව. | කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තු සංකීර්ණයෙන් අයවිය යුතු රු. මිලියන 14.62 කින් රු. මිලියන 9.04 ක් වසර 05 කට වඩා වැඩි කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | පාර්ලිමේන්තු සංකීර්ණයට ලබා දුන් ඖෂධ වෙනුවෙන් අය විය යුතු රු.මිලියන 14.62 ක් අය කර ගැනීම සඳහා කථානායකතුමා, සෞඛ්‍ය ලේකම්තුමා සහ අදාළ පාර්ශවයන් සමඟ කිහිප වතාවක් සාකච්ඡා කළ නමුත් සතුටුදායක පිළිතුරක් නොලැබුණු බව හා 2017 වර්ෂයේදී මෙම මුළු අගයට සමාන බොල් සහ අඩමාන ණය වෙන් කිරීමක් සිදුකර ඇති බව. | -එම- |
| (ඊ) | 2021 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැතියන් රු.මිලියන 7.66 කින් රු.මිලියන 5.68 ක් වර්ෂ 24 ත් වර්ෂ 05 ත් අතර කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | රු.මිලියන 1.33 ක් අයකරගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇති බව හා ඉතිරි වටිනාකම් පිළිබඳව සුදුසු පරිදි ක්‍රියා කරන බව. | -එම- |
| (උ) | 2021 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන් වෙත නිකුත් කර ඇති නමුත් නිරවුල් කර නොතිබුණු අත්තිකාරම් රු.මිලියන 928.52 කින් රු.මිලියන 3.49 ක් වසර 06 ත් වසර 14 ත් අතර කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | සැපයුම්කරුවන් වෙත නිකුත් කර ඇති නමුත් නිරවුල් කර නොතිබුණු අත්තිකාරම් නියමිත කාලසීමාව තුළදී නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

1.6.2 ගෙවිය යුතු මුදල්

-------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------------ | ----------- |
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු. මිලියන258.66 ක් වූ අතර ඉන් රු.මිලියන 132.07 ක් 2022 මැයි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණු අතර ඉන් රු.මිලියන 9.94 ක් වර්ෂ 02 සිට වර්ෂ 04 දක්වා කාලයක් පැරණි නිරවුල් කර නොතිබුණු ශේෂ විය. | පවත්නා තොරතුරු ප්‍රමාණවත් නොවීම හා කොන්ත්‍රාත්කරුවන් විසින් රැඳවුම් මුදල් ඉල්ලා නොසිටීම ආදී හේතු නිසා උපචිත වියදම් නිරවුල් නොකළ බව. | සංස්ථාවේ ප්‍රතිපත්ති හා ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව ගෙවිය යුතු මුදල් නියමිත කාලසීමාව තුළදී පියවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමියන් වෙත ගෙවිය යුතු රු.මිලියන 1,217.07 කින් රු. මිලියන 115.00 ක් වසරකට වඩා කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් ලැබුන විට ගෙවීමේ පදනම මත ඇති වූ වසර 01 කට වැඩි පැරණි වෙළඳ ණයහිමියන් වෙත ගෙවිය යුතු රු.මිලියන 115.00 කින් රු.මිලියන 59.73 ක් මේ වන තෙක් ගෙවා නැති බව හා අදාළ පාර්ශවයන්ගෙන් මුදල් ලැබුන විට පියවන බව. | -එම- |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බැංකු බිල්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 14,489.59 කින් රු.මිලියන 708.42 ක් වසර 02 කට වඩා වැඩි කාලයක සිට සැපයුම්කරුවන් වෙත නොගෙවූ සියයට සියයක ණයවර ලිපි වටිනාකම හා රඳවුම් මුදල් වලින් සමන්විතවී තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟවන බව හා නොගෙවා සිටීමට අදාළ වන හේතු නොපමාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | දිගු කාලයක් තුළ සැපයුම්කරුවන්ට නොගෙවූ වටිනාකම් පිළිබඳව සොයා බලා නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021දෙසැම්බර් 31 දින වන විට ලැබී තිබුණු විශේෂ ඇණවුම් අත්තිකාරම් රු.මිලියන 21.13 කින් රු.982,510 ක් පවුල් සෞඛ්‍ය කාර්යාංශය වෙතින් ලැබී තිබුණු නිරවුල් නොවූ වසර 10 කට වඩා පැරණි ශේෂයක් වන අතර ඉතිරිය යුනිසෙෆ් ආයතනයෙන් ලැබී තිබුණු රු.මිලියන 20.15 ක වසර 2 කට වඩා පැරණි ශේෂයකින් සමන්විතවී තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, ඉදිරි වර්ෂයේදී ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | සැපයුම සම්පූර්ණ කළ වහාම හෝ සැපයුම අත්හැරි වහාම හෝ අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | නියෝජිත කොමිස් නියෝජිතයා වෙත පමණක් ගෙවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නියෝජිත කොමිස් ලෙස රු.550,912 ක් නියෝජිතයා වෙත ගෙවා තිබියදී සැපයුම්කරු වෙතද ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල අයකර ගැනීම සඳහා කටයුතු කරමින් සිටින බව. | සැපයුම්කරුවන් වෙත ගෙවීම් කිරීමට පෙර නියෝජිත කොමිස් නිරවුල් කර ඇති බව තහවුරු කර ගත යුතු අතර වැඩිපුර ගෙවා ඇති මුදල සැපයුම්කරුගෙන් හෝ වගකිව යුතු පාර්ශවයන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත | | | |
| (i) 10(5) වගන්තිය හා 16 දිනැති 2021 දෙසැම්බර් අංක PED/A/REV/1/15 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපිය | සෑම වර්ෂයකදීම පනතේ සඳහන් විසර්ජනයන්ගෙන් පසු ඉතිරි වන ශුද්ධ අතිරික්ත ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපිය ප්‍රකාරව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 350 ක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. එසේ වුවද, 2022 ජූලි 20 දින වන විට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.මිලියන 128 ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැර පිණිස මහා භාණ්ඩාගාරය වෙත යවා තිබුණු අතර යැවීමට ඇති ඉතිරි මුදල් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර හෝ නොතිබුණි. | රජයේ බෙහෙත් ගබඩාවට ඖෂධ සැපයීම තුළින් ලද ලාභයෙන් ගෙවිය යුතු ඉතිරි රු.මිලියන 222 ක මහා භාණ්ඩාගාරය විසින් ලබාදිය යුතු මුදල් ලබාදුන් පසු ගෙවීමට කටයුතු කරන බව. | මුදල් පනත හා අදාළ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපියේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර තව දුරටත් ගෙවිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) 14 (3) වගන්තිය | යම් කිසි වර්ෂයක් වෙනුවෙන් පිළියෙල කරන වාර්ෂික වාර්තාව අදාළ අනෙකුත් ලියවිලි සමඟ ඊළඟ වර්ෂය ආරම්භවී මාස 10 ක් ඉක්මවීමට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මෙම වාර්තාවේ දිනය වන විටත් 2018, 2019 සහ 2020 යන වර්ෂ 03 සඳහා වාර්ෂික වාර්තා පිළියෙල කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 හා 2019 වසර වල වාර්ෂික වාර්තා 2022 ජුනි 15 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශය වෙත ඉදිරිපත් කර ඇති බව, 2020 වසරේ වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම අවසාන අදියරෙහි පවතින බව හා ඉතා කෙටි කාලයක් තුළ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ හැකි බව. | මුදල් පනත හා අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
--------------------------

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 103, 104, 105 හා 107 | 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 191.86 ක් වූ ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී කල් ඉකුත් වූ තොග සහ එදිනට පිරිවැය රු.මිලියන 40.71 ක් වූ ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 395 (ඇ) හා (ඊ) | එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවද, ලංකා බැංකු ජංගම ගිණුමට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ මාස 02 ක ප්‍රමාදයකින් පසුව පිළියෙල කර තිබුණු අතර සම්පත් බැංකු ජංගම ගිණුමට අදාළව 2021 දෙසැම්බර් මාසයෙන් අවසන් මාස 09 සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. එමෙන්ම බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදයන් ගණන්දීමේ නිලධාරී වෙත දැනුම්දී නොතිබුණි. | පවත්නා පරිගණක පද්ධතියේ සීමාකාරී පහසුකම් යටතේ මුදල් පොත සහ බැංකු සැසඳුම පිළියෙල කරන බව, මේ වන විට පවතින පරිගණක පද්ධතිය අවශ්‍ය පහසුකම් සහිතව යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇති බව, සම්පත් බැංකුවේ ගිණුම විකුණුම් ප්‍රවර්ධන කාර්යයක් ලෙස ආරම්භ කළ ගිණුමක් බැවින් ගනුදෙනු සිදුවූ මාසවලට අදාළව පමණක් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඇති බව හා ගනුදෙනු සිදු නොවුනද ඉදිරියේදී බැංකු සැසඳුම මාසිකව පිළියෙල කරන බව. | -එම- |
| (iii) මුදල් රෙගුලාසි 756 හා 757 (2) | ස්ථාවර වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කර එම සමීක්ෂණ වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණ වාර්තා 2022 ජුනි 05 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික ස්ථාවර වත්කම් සමීක්ෂණය නිමකර සමීක්ෂණ වාර්තාව පිළියල කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව හා එය නිමවූ වහාම පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ ඉතිරි වාර්ෂික නිවාඩු සඳහා රු.මිලියන 70.63 ක්ද, එක් සේවකයෙකු වෙත මාසික වේතනයක් බැගින් කාර්යසාධන දිරි දීමනා ලෙස රු.මිලියන 70.92 ක්ද කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි. | සංස්ථාවේ සාමූහික ගිවිසුමේ 6(ii)d වගන්තියෙන් දැනටමත් ලබා ගෙන ඇති අනුමැතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන දිරි දීමනා ගෙවා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 දෙසැම්බර් 07 දිනැති අංක PED/03/2018 හා 2021 දෙසැම්බර් 15 දිනැති අංක PED/03/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | සාමූහික ගිවිසුමක් සහිත සංස්ථාවට මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ කර ගත නොහැකි වන නමුත් මෙම චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කරමින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එක් සේවකයකුට රු.13,500 බැගින් රු.මිලියන 12.47 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි 4.3 ඡේදය | ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම්, මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම්වල බලපෑම ගණනය කිරීම හා ආයතනයේ ක්‍රියාකාරිත්වයට බලපාන අවදානම් අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සංස්ථාව විසින් අවදානම් කළමනාකරණ කමිටුවක් පත් කළ යුතු වුවද, 2022 මැයි 31 දින වන විටත් එම කමිටුව පත්කර නොතිබුණි. | අවදානම් කළමනාකරණ කමිටුවක් පත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් පිළියල කර ඇති බව හා ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව. | -එම- |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 122.52 ක් වූ පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා චක්‍රලේඛ විධිවිධාන වලට අනුගත වන ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා වන ස්ථාවර වත්කම් ලේඛනයක් පරිගණක අංශය විසින් පවත්වා ගෙන යනු ලබන බව. | -එම- |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,384,563,878 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,969,223,517 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.415,340,361 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම සියයට 27 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ වෘත්තීය සේවා වියදම පිළිවෙලින් රු.976,783 ක් හා රු.10,660,320 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 991 කින් වැඩිවී තිබුණි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් බාහිර පාර්ශව වෙතින් වෘත්තිමය සේවා පහසුකම් වැඩියෙන් ලබා ගැනීම හේතුවී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙළින් සියයට 0.5 කින් සහ සියයට 0.1 කින්ද, ණයගැති පිරිවැටුම් අනුපාතය වාර 0.2 කින්ද අඩුවී තිබුණු අතර ණය අයකර ගැනීමේ කාලය දින 17 කින් වැඩිවී තිබුණි. ඒ පිළිබඳ අවධානය යොමු කරමින් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාවේ අලෙවිකරණ ක්‍රියාවලිය සඳහා ප්‍රමිත ගත මෙහෙයුම් ක්‍රියාපටිපාටි (Standard Operating Procedure) පිළියෙල කර නොතිබුණි. | සංස්ථාවේ අලෙවිකරන ක්‍රියාවලිය සඳහා ප්‍රමිතගත මෙහෙයුම් ක්‍රියාපටිපාටි පිළියෙල කිරීම සඳහා නිලධාරීන් 4 කින් යුත් කමිටුවක් පත් කරන බව. | ප්‍රමිත ගත මෙහෙයුම් ක්‍රියාපටිපාටි සකස්කර අනුමත කරවා ගත යුතුය. |
| (ආ) | වෛද්‍ය සැපයීම් කළමනාකරණය සඳහා 2015 වර්ෂයේ සිට හදුන්වාදී තිබුණු වෛද්‍ය සැපයීම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MSMIS) නිසි පරිදි උපයෝගී කර ගෙන නොතිබුණු බවත්, ඖෂධ ඇණවුම් කිරීමේ සිට තොග ලැබෙන අවස්ථාව දක්වා එක් එක් පියවර පද්ධතියට ඇතුළත් කර (Status) අදාළ ඇණවුම සම්බන්ධ ප්‍රගතිය යාවත්කාලීන කිරීමේ පහසුකම එම පරිගණක පද්ධතිය මගින් ලබාදී තිබුණු නමුත් සංස්ථාවේ නිලධාරීන් ඇණවුමට අදාළ තොරතුරු වසර 07 ක් තිස්සේ පැවති | Pronto පරිසනක පද්ධතිය හරහා ඇනවුම් ඉදිරිපත් කළද එම ඇණවුම්වල නෛතික වලංගු භාවය සනාථ කිරීමට වෛද්‍ය සැපයීම් අංශයේ නිලධාරීන්ගේ අත්සන නොමැති බව, MSD විසින් පද්ධතිගත කරන ලද ඇණවුමකට සංස්ථාව විසින් පද්ධතියට ගැණුම් ඇණවුමක් ඇතුළත් කරන තෙක් කාලය තුළ MSD හට අවශ්‍ය ඕනෑම මොහොතක ඇණවුම වෙනස් කිරීමේ හෝ පද්ධතියෙන් | සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා වෛද්‍ය සැපයීම් අංශයේ උපදෙස් හා සම්බන්ධීකරණය තුළින් සංස්ථාවද Pronto පරිගණක පද්ධතිය තුළ යාවත්කාලීන විය යුතුය. ඒ සඳහා ඇති බාධාවන් ඉවත් කර ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් පද්ධතියට ඇතුළත් නොකරන බවත් නිරීක්ෂණය විය. එසේම සංස්ථාව විසින් ඇණවුමට අදාළ තොරතුරු වෙනත් පරිගණක පැවරුම්පත් (Excel) හරහා ගබඩා කර තිබුණු බැවින් ටෙන්ඩරයක තාක්ෂණික ඇගයීම් සිදුකළ දිනය, ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාදුන් දිනය, ණයවර ලිපි විවෘත කළ දිනය ආදී තොරතුරු පහසුවෙන් ලබා ගත නොහැකිවීම හේතුවෙන් ප්‍රසම්පාදනයේ ප්‍රමාදයට වගකිව යුතු වන්නේ කවුරුන්දැයි පරීක්ෂා කිරීමට හා තීරණ ගැනීමට මෙන්ම ඇණවුමේ වර්තමාන ප්‍රගතිය පිළිබඳව තොරතුරු දැනගැනීමට වැඩි කාලයක් ගතවන බව නිරීක්ෂණය විය. වෛද්‍ය සැපයීම් අංශය විසින් ඒ ඒ වර්ෂයට අදාළ ඇණවුම් ලැයිස්තු මාස 11 ක සැපයුම් කාලයක් සහිතව (Lead Time) සංස්ථාව වෙත මෙම පරිගණක පද්ධතිය හරහා ඉදිරිපත් කරන නමුත් ,සංස්ථාව විසින් වහාම එම ඇණවුම්වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණු බවත්, ඇණවුම් ලැයිස්තුවේ ලිඛිත පිටපත් සංස්ථාව වෙත ලැබෙන තෙක් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද කර තිබුණු බවත්, පරිගණක පද්ධතිය හරහා සංස්ථාව වෙත නිකුත් කරන ඇණවුම්වල ලිඛිත පිටපත් සංස්ථාවේ ආනයන අංශයට එවීමට දින 18 කට වඩා වැඩි කාලයක් ගතකර තිබුණු අතර ඉන් පසුව පමණක් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණු බැවින් මාස 11 ක් වූ සැපයුම් කාල සීමාවෙන් සැලකිය යුතු කාලයක් ඇණවුම් නිකුත් කිරීමේ හා ඇණවුම් ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා ගත කර තිබුණු බවත් නිරීක්ෂණය විය. | ඉවත් කිරීමේ හැකියාව ඇති බව, තවද සැපයුම් කොන්දේසි (Conditions of Supply) නොමැතිව ලංසු කැඳවිය නොහැකි බව, සෑම ඇණවුමකටම Conditions of Supply පොදු බවට සනාථ කිරීමක් MSD විසින් සිදුනොකරන බව හා සංස්ථාවට පිළිගත හැකි පරිදි ලැබෙන දෘඩ පිටපත පදනම් කොට ප්‍රසම්පාදනය ආරම්භ කරන බව. | කළ යුතුය. |
| (ඇ) | සංස්ථාව සිය මෙහෙයුම් හා පරිපාලන කාර්යයන් සඳහා කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) 14 ක් භාවිතා කරන අතර ඉන් පද්ධති 12 කින් ඉටුවන කාර්යයන් එක් පද්ධතියක් මගින් ඉටුකර ගැනීම සඳහා නව ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමින් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු නමුත් සුදුසු කොන්ත්‍රාත්තුකරුවෙකු තෝරා ගැනීමට අපොහොසත් වීම මත ඇතිවූ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2020 පෙබරවාරි 20 දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා | 2019 වසරේදී ව්‍යාපෘතිය අතහැර දැමීමෙන් අනතුරුව ඉතිරිව පැවති උපාංග යල් පැන යාමට ප්‍රථම උපරිම ප්‍රයෝජන ලබා ගැනීමේ අරමුණින් ආයතනයේ විවිධ අවශ්‍යතාවයන්ට අනුව භාවිතයට ගත් බව, වර්තමානයේ භාවිතයේ පවතින පද්ධතීන්වල ඇති විවිධ ගැටළු විසඳා ගැනීම සහ ආයතනයේ කටයුතු වඩාත් කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස පවත්වාගෙන යාමේ අරමුණෙන් නව Enterprise Resource Plan | නව ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතීන් ගොඩනැගීම හා ක්‍රියාත්මක කිරීම කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2018 සහ 2019 වර්ෂයන්හිදී පිරිවැය රු.මිලියන 32.36 ක් වූ පරිගණක උපාංග අයිතම 09 කින් ඒකක 497 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් ව්‍යාපෘති කටයුතු සඳහා භාවිතා නොකළ පිරිවැය රු.මිලියන 26.11 ක් වූ අයිතම 09 ක ඒකක 375 ක් සංස්ථාවේ වෙනත් කාර්යයන් සඳහා භාවිතයට නිකුත් කර තිබුණි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන තිබුණු පිරිවැය රු.මිලියන 6.25 ක් වූ පරිගණක හා උපාංග අයිතම 06 කින් ඒකක 122 ක් විගණිත දිනය වූ 2022 ජුනි 09 වන විටත් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යයව පැවතුණි. වර්තමානයේ භාවිතා කරන පද්ධති 12 පාවිච්චි කරන පරිශීලකයින් ගණන 324 ක් වුවද නව පද්ධතිය භාවිතා කිරීමට අපේක්ෂිත පරිශීලකයින් ගණන 1,399 ක් වූ බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම සංස්ථාවේ සියලුම අංශවල කටයුතුවලට දැඩි ලෙස බලපා තිබුණි. | (ERP පද්ධතිය) හඳුන්වාදීමට උත්සාහ කරන බව හා එහි ප්‍රසම්පාදන කටයුතු අවසාන අදියරේ පැවති නමුත් රට තුල හදිසියේ පැන නැගුණු ආර්ථික ගැටළු හේතුවෙන් එම කටයුතු සාර්ථක කර ගැනීමට නොහැකි වූ බව, හැකි ඉක්මනින් වඩාත් ඵලදායී නව පද්ධතියක් හඳුන්වා දීමට බලාපොරොත්තු වන බව. | |
| (ඇ) | සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් තත්ත්වය පිළිබඳ පැවති අඩුපාඩු හේතුවෙන් අලෙවිය සඳහා නිකුත් නොකර රඳවා ගෙන තිබුණු මුළු පිරිවැය රු. මිලියන 4.94 ක් වූ ඖෂධ අයිතම 09 ක් 2022 අප්‍රේල් 22 දින වන විටත් කල් ඉකුත් වී තිබුණි. එම තොග සම්බන්ධයෙන් නිසි පියවර නිසි අවස්ථාවේදී නොගැනීම නිසා සංස්ථාවට රු.මිලියන 4.94 ක අලාභයක් සිදුව තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | නිකුත් නොකර රඳවා ගත් ඖෂධ තොග කල් ඉකුත්වීමට පෙර නිසි පියවර නිසි අවස්ථාවේදී ගත යුතුය. |
| (ඉ) | 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ වර්ෂ 17 ක කාලපරිච්ඡේදය තුළදී වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු නමුත් එම අංශය විසින් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසා රඳවා ගෙන තිබුණු පිරිවැය ගණනය කළ නොහැකි වෛද්‍ය සැපයුම් තොග හා මුළු පිරිවැය රු.මිලියන 345.25 ක් වූ වෛද්‍ය සැපයුම් තොග පෞද්ගලික ගබඩාවල ගබඩා කිරීමට සිදුවී තිබීම හේතුවෙන් එම කාලපරිච්ඡේදය තුළදී සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු මුළු අතිරේක ගබඩා පිරිවැය රු.මිලියන 19.81 ක් විය. වෛද්‍ය සැපයීම් අංශය විසින් එම තොග ප්‍රතික්ෂේප කිරීමට හේතු සොයා බැලීමට හෝ ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණු අතර | වෛද්‍ය සැපයුම් අංශය මගින් ප්‍රතික්ෂේප කරන ලද තොග අතරින් රු.මිලියන 79.98 ක වටිනාකමින් යුතු භාණ්ඩ තොග 2022 ජුනි 30 දින වන විට වෛද්‍ය සැපයුම් අංශය විසින් නැවත භාරගෙන ඇති බව, එමෙන්ම වෛද්‍ය සැපයීම් අංශය මගින් ප්‍රතික්ෂේප කරන ලද තවත් තොග අයිතම 116 ක තොග අපහරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව, එම තොගය අපහරණය කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන Insee Ecocycle ආයතනයේ අනුමැතිය ලැබීමෙන් පසුව මෙම තොගය අපහරණය කිරීමට නියමිත ඇති | වෛද්‍ය සැපයුම් අංශය භාරගැනීම ප්‍රතික්ෂේප කළ තොග අයිතම සම්බන්ධයෙන් ගත යුතු පසු බෙදාහැරීම් මෙහෙයුම් කටයුතු හැකි ඉක්මනින් අවසන් කර ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සඳහා හැකි ඉක්මනින් යොමුවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එම තොග විධිමත් ලෙස අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබීම හේතුවෙන් ගබඩා පිරිවැය දිනෙන් දින වැඩිවෙමින් පවතින බවද නිරීක්ෂණය විය. | බව, එමෙන්ම තවදුරටත් ඉතිරිව ඇති තොග සඳහා 2021 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද තොග සමීක්ෂණ වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අනුමැතිය ලබාගෙන ඉදිරියේදී එම තොගයද අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | |
| (ඊ) | වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා සංකීර්ණයේ ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොතිබීම නිසා සංස්ථාව විසින් 2021 සහ 2022 වර්ෂවලදී ආනයනය කර තිබුණු ඉන්ඩෙන්ටු 28කට අදාළ බහලුම් 28 ක් 2021 අගෝස්තු 20 දින සිට 2022 පෙබරවාරි 21 දින දක්වා වූ මාස 06 ක කාලයක් පෞද්ගලික ගබඩාවක රඳවා තබා ගෙන තිබුණු අතර එම මාස 06 සඳහා ගබඩා පිරිවැය ලෙස රු.මිලියන 48.28 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණි. නමුත් සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු මෙම අතිරේක පිරිවැය වෛද්‍ය සැපයීම් අංශයෙන් අයකර ගෙන නොතිබුණි. | මෙම මුදල් අයකර ගැනීම සඳහා මේ වන විට වෛද්‍ය සැපයුම් අංශය වෙත හරපත් නිකුත්කර ඇති බව. | වෛද්‍ය සැපයීම් අංශයෙන් අයකරගත යුතු අතිරේක ගබඩා පිරිවැය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානි වූ ඖෂධ සපයා තිබීම සහ ඖෂධ අඩුවෙන් සපයා තිබීම හේතුවෙන් ඒ සඳහා වැය කර තිබුණු පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරීමේ වියදම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු රු.මිලියන 943.75 ක හරපත් සඳහා මුදල් අයකර ගැනීමට 2022 ජුනි 30 දින වන විටත් අපොහොසත් වී තිබුණි. ඉන් රු.මිලියන 71.03 ක් අසාධු ලේඛනගත සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු වූ බැවින් අයකිරීම් අවිනිශ්චිත තත්වයක පැවතුණි. | 2022 ජුනි 30 දි වන විට තවදුරටත් අයකර ගත යුතු වටිනාකම වන රු.මිලියන 943.75 ක් අතරින් රු.මිලියන 693.38 ක් ගෙවීම් පැහැර හැරි සැපයුම්කරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව, රු.මිලියන 20.82 ක් අයකර ගත නොහැකි බවට හඳුනාගෙන ඇති බව, රු.මිලියන 9.311 ක් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිර්දේශයට අනුව සංශෝධනය කිරීමට නියමිතව ඇති බව, රු.මිලියන 71.03 ක් ගෙවීම් පැහැර හැරීම නිසා අදාළ සැපයුම්කරුවන් අසාදු ලේඛන ගත කිරීමට නියමිතව ඇති බව, රු.398,242 ක් සැපයුම්කරුවන් විසින් ගෙවීමට එකඟවී ඇති බව, රු.මිලියන 2.24 ක් සඳහා සැපයුම්කරුවන් විසින් නොමිලේ ප්‍රති සැපයුම් කිරීමට එකඟවී ඇති බව හා ඉතිරිව ඇති රු.මිලියන 146.58 ක් සැපයුම්කරුවන්ගෙන් තවදුරටත් අයකර ගනිමින් පවතින බව. | මේ වන විට අයකර නොගත් මුදල් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම කාර්යක්ෂම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | මූලා ප්‍රකාශනවලට අනුව සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් 2021 ජනවාරි 01 දින වන විට තත්වයෙන් අසමත්, කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධවල මුළු පිරිවැය රු.මිලියන 215.48 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී තත්වයෙන් අසමත්, කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධවල මුළු පිරිවැය රු.මිලියන 128.93 ක් විය. ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් ඖෂධවල මුළු පිරිවැය රු.මිලියන 40.71 කින් රු.මිලියන 25.04 ක් 2022 ජුනි 01 දින වන විටත් සැපයුම්කරුවන්ගෙන් අය කර ගෙන නොතිබුණි. තවද ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඖෂධ කල්ඉකුත්වීම හා හානිවීම නිසා සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු මුළු අලාභය රු.මිලියන 191.86 ක් විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | තත්ත්වයෙන් අසමත් ඖෂධවල වටිනාකම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමටත් ඖෂධ කල් ඉකුත්වීමට හේතු සොයාබලා පිළියම් යෙදීමටත් හා එම හේතුවලට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (එ) | සංස්ථාව සතු ඔසුසැල් 50 න් ඔසුසැල් 26 ක්ම සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 53.24 ක අලාභ ලබා තිබුණි. ඉන් ඔසුසල් 10 ක අලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 15 සිට සියයට 175 දක්වා වූ පරාසයකින් ඉහළ ගොස් තිබුණි. තවද, ඉකුත් වර්ෂය තුළ ලාභ ලබා තිබුණු රත්නපුර, ශ්‍රී ජයවර්ධනපුර රෝහල, බණ්ඩාරගම හා මොනරාගල ස්ථාපිත ඔසුසැල් 04 සමාලෝචිත වර්ෂයේදී අලාභ ලබා තිබුණි. ඔසුසල් 09 ක ඉකුත් වර්ෂයේදී ලැබී තිබුණු ලාභය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ලාභය සියයට 5.7 සිට සියයට 7,411 දක්වා පරාසයකින් අඩුවී තිබුණු බවද නිරීක්ෂණය විය. Covid 19 වසංගත තත්ත්වය මීට හේතුවූ බව සභාපතිවරයා විසින් දන්වා තිබුණි. | නිරීක්ෂණය සමග එකඟ වන බව, 2021 වර්ෂය තුළදී පැවති COVID-19 වසංගත තත්ත්වය ඊට හේතු වූ බව. | අලාභ ලබන ඔසුසල් පිළිබඳව නිරන්තර අධීක්ෂණයක් සිදුකරමින් අලාභ ලැබීමට බලපෑ හේතු සොයා බලා පිළියම් යෙදීම තුළින් අලාභ අවමකර ගැනීමට හෝ ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2021 දෙසැම්බර් 31 දිනට ඔසුසැල්වල භෞතික තොග සමීක්ෂණ වාර්තාවලට අනුව තොග අතිරික්තය රු.මිලියන 4.85 ක් හා තොග ඌනතාවය රු.මිලියන 5.41 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 5.94 ක් හා රු.මිලියන 5.94 ක් විය. විකුණුම් ඉන්වොයිස් පිළියෙල කිරීමේදී හා තොග ඇසුරුම් ගත කිරීමේදී සිදු වන දෝෂ, පරිගණක පද්ධතියේ සිදු වන දෝෂ, | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | සෑම වසරකදීම සිදුවන මෙම තොග ඌනතා හා අතිරික්තතා ඇතිවීමට හේතුවන දෝෂ හඳුනාගෙන ඒවා අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග |

| | | | |
|---|---|---|---|
| | කාර්යය මණ්ඩලය වෙතින් සිදුවන අඩුපාඩු, පෙති හා කරල් ඖෂධ තොග ලෙස ඇසුරුම් කර නිකුත් කිරීමේදී සුළු ප්‍රමාණ ලෙස නිකුත් කිරීම මගින් ලේබලයේ අඩංගු ප්‍රමාණය සමඟ සිදුවන නොසැසඳීම් ආදී වූ කරුණු තොග ඌනතා හා අතිරික්තතා ඇතිවීමට හේතු වන බව හඳුනාගෙන තිබුණු නමුත් එම දෝෂ අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගැනීමට හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. | | ගැනීමටකටයුතු කළ යුතු අතර ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඔ) | 2016 වර්ෂයේ සිට 2022 පෙබරවාරි 11 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී සංස්ථාව විසින් ආනයනය කර වෛද්‍ය සැපයුම් අංශය වෙත භාරදී තිබුණු ඉන්ඩෙන්ටු 10 කට අදාළ පිරිවැය රු.මිලියන 35.76 ක් වූ තොග බහලුම් සම්පූර්ණ නොවීම නිසා (Low Consignment Load) වෛද්‍ය සැපයීම් අංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. මෙම අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා සංස්ථාව ක්ෂණිකව කටයුතු කර නොතිබීම හේතුවෙන් එම අයිතම 10 ට අදාළ තොග බහලුම් ගබඩා කර තැබීම වෙනුවෙන් වසරක කාල සීමාවක් සඳහා පමණක් රු.මිලියන 1.17 ක ගබඩා පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. | පිරිවැය රු.මිලියන 35.76 ක් වූ තොග අතරින් පිරිවැය රු.මිලියන 4.87 ක් වූ තොග නැවත වෛද්‍ය සැපයීම් අංශයට භාර දීමට කටයුතු කරන බව, රු.මිලියන 3.56 ක් වූ තොගවලට අදාළ පිරිවැය සැපයුම්කරුගෙන් අයකර ගැනීමට හරපත් නිකුත් කර ඇති බව, එමෙන්ම රු.993,877 ක් වූ තොග වලට අදාළ පිරිවැය සැපයුම්කරු විසින් සංස්ථාවට පියවා ඇති බව හා පිරිවැය රු.මිලියන 26.34 ක් වූ ඉතිරි තොග වලට අදාළව ඉදිරි කටයුතු සිදු කරන බව. | වෛද්‍ය සැපයීම් අංශය විසින් අදාළ තොග ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා වන පසු බෙදාහැරීම් මෙහෙයුම් (Post Delivery Operation) කටයුතු ක්ෂණිකව සිදු කිරීම මගින් දැරීමට සිදුවන මෙම අතිරේක ගබඩා පිරිවැය අවමකර ගැනීමට කටයුතු කළ යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථා අලෙවිය තුළින් රු.මිලියන 10,673.50 ක අලෙවි ඉලක්කයක් අපේක්ෂා කර තිබුණු නමුත් සත්‍ය අලෙවිය රු.මිලියන 9,430.95 ක් පමණක් වූයෙන් අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 11 ක් වූ රු.මිලියන 1,242.55 ක අලෙවි ඉලක්කයක් ලඟාකර ගත නොහැකිවී තිබුණි. එසේම වෛද්‍ය සැපයුම් අංශය වෙත රු.මිලියන 127,913.98 ක අලෙවි ඉලක්කයක් අපේක්ෂා කර තිබුණු නමුත් සත්‍ය අලෙවිය රු.මිලියන 70,110.43 ක් පමණක් වූයෙන් අපේක්ෂිත ඉලක්කයෙන් | Covid 19 වසංගත තත්ත්වය මෙන්ම වෛද්‍ය සැපයුම් අංශය විසින් සමහර ඇණවුම් ඉදිරි වර්ෂවලට විතැන් කිරීම හා සමහර ඇණවුම් සම්පූර්ණයෙන්ම අවලංගු කිරීම වැනි කරුණු මෙම තත්ත්වයට හේතුවී ඇති බව. | තාත්ත්වික ඉලක්ක සහිත අලෙවි සැලසුම් පිළියෙල කළ යුතු අතර එම සැලසුම් කාලීන අවශ්‍යතා හා වෙනස්වීම්වලට අනුව අවශ්‍ය වෙනස්කම් සිදුකරමින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිමයෙන් කටයුතු කළ යුතුය. |

සියයට 45 ක් වූ රු.මිලියන 57,803.55 ක අලෙවි ඉලක්කයක් ලඟාකර ගත නොහැකිවී තිබුණි. Covid 19 වසංගත තත්ත්වය මෙන්ම වෛද්‍ය සැපයුම් අංශය විසින් සමහර ඇණවුම් ඉදිරි වර්ෂවලට විතැන් කිරීම හා සමහර ඇණවුම් සම්පූර්ණයෙන්ම අවලංගු කිරීම වැනි කරුණු ඊට හේතුවූ බව සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු ඔක්සිජන් තොග අදාළ සැපයුම්කරු විසින් ඍජුවම රෝහල් වෙත සපයා තිබුණු බැවින් ඒවා වෛද්‍ය සැපයීම් අංශය වෙත ලද බවට සහතික කරන මුද්‍රාව සහිත ඉන්වොයිසි සංස්ථාව වෙත ලබා ගෙන නොතිබීම නිසා අදාළ හරපත් (Debit Note) නිකුත් කිරීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. ඒ හේතුවෙන් සැපයුම්කරු වෙත ගෙවා තිබුණු රු.මිලියන 169.26 ක් වූ අත්තිකාරම් 2022 මැයි 31 වන දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | නිවැරදි අවස්ථාවේදී නියමිත ඉන්වොයිසි වගකිව යුතු පාර්ශව වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රත්මලාන ගබඩාවේ අලෙවි කළ හැකිව පැවති 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව මුළු පිරිවැය රු.මිලියන 79.23 ක් වූ අයිතම 98 ක් ඉතා කෙටි ජීව කාලයක් ( Short Shelf Life) සහිත 2022 වසර තුළදී කල් ඉකුත් වන අයිතම විය. ඒ අතරින් පිරිවැය රු.මිලියන 43.50 ක් වූ අයිතම 74 ක් වසරකට වඩා වැඩි කාලයක් තුළදී නොවිකිණී පැවති තොග විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ඉතිරි තොගවල ජීව කාලය පිළිබඳව නිරන්තර පසු විපරමකින් කටයුතු කරමින් ඒවායේ තොග මට්ටම් පිළිබඳව අවධානය යොමු කරමින් තොග අලෙවියට හො බෙදාහරින්නන් වෙත හෝ නිවැරදි අවස්ථාවේදී නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

3.3 අවිධිමත් ගනුදෙනු
---------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | සංස්ථාවේ අලෙවිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 12.48 වැය කර Famotidine Tablets USP (40mg) ඖෂධයේ (10*10) ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 90,000 ක් මිලදී ගෙන තිබුණි. ගබඩාව වෙත ලැබී තිබුණු | අදාළ තොග වටිනාකම සැපයුම්කරුගෙන් අය කර ගැනීම සඳහා හරපතක් නිකුත් කර ඇති බව, ප්‍රමාද ගාස්තු වෙනුවෙන් නිකුත් කළ | විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග |

| | | | |
|---|---|---|---|
| | කාණ්ඩ 02 ක ඖෂධවල කල් ඉකුත්වීමේ දිනය පැනකින් වෙනස්කර තිබුණු බව තහවුරු විය. 2021ඔක්තෝම්බර් 27 දින ගුණාත්ව දුර්වලතා කමිටුව විසින් ලබාදී තිබුණු නිර්දේශය ප්‍රකාරව මෙම ඖෂධයේ සියළුම කාණ්ඩවල තොග ප්‍රතික්ෂේප කිරීමට හා තොග ආපසු කැඳවීමට (Withdraw) කටයුතු කර නොතිබුණි. 2022 ජනවාරි 05 දින වන විට කල්ඉකුත් වීමේ දිනය වෙනස් කර තිබුණු පිරිවැය රු.මිලියන 1.30 ක් වූ ඇසුරුම් ඒකක 9,376 ක් පමණක් ඉතිරිව තිබුණු බැවින් සැපයුම භාරගත් දිනය වන විටත් කල් ඉකුත්වී තිබුණු ඖෂධ අලෙවි කර තිබුණු බව නිරීක්ෂණය විය. මෙම සැපයුමට අදාළ දින 22 ක ප්‍රමාදය වෙනුවෙන් තවදුරටත් අයවිය යුතු රු.914,057 ක් වූ ප්‍රමාද ගාස්තු මෙම වාර්තාවේ දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | හරපතෙන් කොටසක් මේ වන විට අය කර ගෙන ඇති බව හා ඉතිරි අය කර ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | ගැනීමට කටයුතු කළ යුතු අතර සැපයුම්කරුගෙන් අයකර ගත යුතු මුදල් අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | සාමාන්‍ය මාසික විකුණුම් ප්‍රමාණය ඇසුරුම් ඒකක 1,159 ක් වූ බැවින් වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය ඇසුරුම් ඒකක 13,908 ක් වුවද ඒ බව නොසලකා හා පෙර ඇණවුමකින් ඇසුරුම් ඒකක 40,000 ක් සංස්ථාව වෙත ලැබීමට නියමිතව තිබුණු නමුත් ඒ බවද නොසලකා, සංස්ථාවේ අලෙවිය සඳහා 2019 වර්ෂයේදී Levofloxacin Tablets (500 mg) ඖෂධයේ (3*10) ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 72,000 ක් ඇණවුම් කර ඉන් ඇසුරුම් ඒකක 36,000 ක් රු.මිලියන 5.52 කට මිලදී ගෙන තිබුණි. පෙර ඇණවුමකින් සපයා ගෙන තිබුණු ඇසුරුම් ඒකක 9,092 ක් හා ඇසුරුම් ඒකක 36,000 න් ඇසුරුම් ඒකක 22,357 ක් 2022 පෙබරවාරි 28 දින වන විටත් අලෙවිකර ගැනීමට අපොහොසත්වී තිබුණු අතර ඒ වන විට එම ඇසුරුම් ඒකක 45,092 ම කල් ඉකුත්වී තිබීම හේතුවෙන් රු. මිලියන 5.24 ක අලාභයක් සිදුවී තිබුණි. නමුත් ඊට වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට හා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතනය තුළ ඖෂධ තොග ශූන්‍ය වීමකින් තොරව පවත්වා ගැනීම සඳහා මෙම ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

--------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------------ | ----------- |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 373.20 ක් වැයකර ඖෂධ මිලදී ගැනීමේ අවස්ථා 03 කදී පොදු කොන්ත්‍රාත් පනත යටතේ කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීමේ සහතිකය සැපයුම්කරු වෙතින් | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු |

| | | | |
|---|---|---|---|
| | ලබාගෙන නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම පිළිබඳව සංස්ථාව අනුගමනය කරන ක්‍රියාපිළිවෙත අනුව රු.මිලියන 50 ඉක්මවන ප්‍රසම්පාදනයන් ඇගයීම සඳහා 05දෙනෙකුගෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙනුවට තිදෙනෙකුගෙන් පමණක් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර තිබුණි. | | ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. |
| (ආ) | කොවිඩ් 19 වසංගතය සමඟ ඇති වූ හදිසි ප්‍රසම්පාදනයක් ලෙස හඳුනාගෙන සෘජු මිලදී ගැනීමේ ක්‍රමය අනුගමනය කරමින් , කිසිදු තාක්ෂණික ඇගයීමක් සිදු නොකර, එක් සැපයුම්කරුවෙකු විසින් ඉදිරිපත් කර තිබුණු මිල කියුම මත පදනම්ව ප්‍රසම්පාදනය සිදුකර, සංස්ථාවේ අලෙවිය සඳහා 2020 වර්ෂයේදී රු.මිලියන 14.27 ක් වැයකර එකක් රු.1,400 බැගින් Safety Goggles 10,000ක් හා එකක් රු.1,350 බැගින් Safety Goggles 200ක්මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමින් සියයට 20 ක අත්තිකාරමක් ගෙවිය හැකි නමුත් ඊට පටහැනිව සියයට 50 ක අත්තිකාරමක් ලෙස රු.මිලියන 07 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබුණු මිලකියුමට, ගැණුම් ඇණවුමට හා භාණ්ඩ ලැබීම් පත්‍රයට අනුව Seals Safety Goggles සපයා තිබිය යුතු වුවද, ඒ වෙනුවට Swimming Goggles 10,200 ක් සපයා තිබුණු බව සිදුකළ භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය. අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව හා නිසි අලෙවි පුරෝකථනයකින් තොරව මිලදී ගෙන තිබීම හේතුවෙන් Swimming Goggles 10,200 න් 54 ක් පමණක් එකක් රු.1,610 බැගින් අලෙවිකර තිබුණු අතර මුළු පිරිවැය රු.මිලියන 13.92 ක් වූ Swimming Goggles 9,945 ක් ඉතිරිව පැවති බවත් මුළු පිරිවැය රු.281,400 ක් වූ Goggles 201 ක ඌනතාවයක් පැවති බවත් 2021නොවැම්බර් 09 හා 24 යන දිනවලදී සිදුකළ භෞතික පරීක්ෂණයේදී අනාවරනය විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා 2020 වර්ෂයේදී පිරිවැය රු.මිලියන 21.49 ක් වූ පුද්ගල ආරක්ෂක උපකරණ (Personal protective equipment-(PPE)) කට්ටල 5,000 ක් මිලදී ගෙන තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය විසින් හෝ සංස්ථාව විසින් PPE කට්ටල සඳහා අවශ්‍යතා පිරිවිතර පිළියෙල කර නොතිබුණු අතර කිසිදු ආකාරයක මිල කැඳවීමක් හා තාක්ෂණික ඇගයීමක් සිදු නොකර එක් සැපයුම්කරුවෙකු විසින් ඉදිරිපත් කර තිබුණු Profoma Invoice මත මිලදී ගැනීම සිදු කර තිබුණි. ඇනවුම් කර තිබුණු PPE කට්ටල 5,000 න් කට්ටල 2,000 ක තොගයක් සංස්ථාව වෙත ලැබී වෛද්‍ය සැපයීම් අංශය වෙත යවා තිබුණු නමුත්, සපයා ඇත්තේ “Isolation Gown” පමණක් බවත් වෛද්‍ය සැපයීම් අංශය ඉදිරිපත් කළ ඇණවුමේ සඳහන්ව ඇත්තේ “PPE Set” වශයෙන් බවත් සඳහන් කරමින් අදාළ තොගය භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි.එසේ තිබියදී PPE කට්ටල 3,000 කින් සමන්විත දෙවන තොගයද සැපයුම්කරු වෙතින් භාර ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත යවා තිබුණු නමුත් පෙර දැක්වූ හේතුවම දක්වමින් එම තොගයද ප්‍රතික්ෂේප කර තිබුණි. සැපයුම්කරු වෙත ගෙවා තිබුණු රු.මිලියන 21.49 ක් හා සේවා ගාස්තු රු.මිලියන 8.13 ක් වෛද්‍ය සැපයීම් අංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකිවීම නිසා සංස්ථාවට රු.මිලියන 29.62 ක අලාභයක් සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සිදු කළ භෞතික පරීක්ෂාවකදී PPE කට්ටල 4,997 ක් ගබඩාවේ පැවති බවත්, කට්ටල 03 ක ඌනතාවයක් පැවති බවත් නිරීක්ෂණය විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | -එම- |
| (ඇ) | වෛද්‍ය සැපයුම් අංශය විසින් 2021 වර්ෂයෙහි අවශ්‍යතාවය ලෙස හඳුනාගෙන තිබුණු Papaverine HCL injection 60mg/2ml එන්නතින් ඒකක 1,560 ක් රු.මිලියන 68.59 ක් වැය කර මිලදී ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා සංස්ථාව විසින් සිදු කර තිබුණු අන්තර්ජාතික විවෘත තරඟකාරී ලංසු කැඳවීමට අනුව එක් ලංසුකරුවෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු බැවින්ද හා එන්නත් ඒකකයක ඇස්තමේන්තු මිල රු.255.07 ක් වුවද ඒකකයක් සඳහා ලංසුව රු.40,868.98 ක්වූ බැවින්ද, නැවත මිල ගණන් කැඳවිය යුතුව තිබුණු නමුත් එපරිදි කටයුතු නොකර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම එන්නත් ඒකකයක් රු.40,868.98 ක් බැගින් එන්නත් ඒකක 3,125 ක් රු.මිලියන 127.72 කට මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම පිළිබඳව සංස්ථාව | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | -එම- |

අනුගමනය කරන ක්‍රියාපිළිවෙත අනුව රු.මිලියන 50 ඉක්මවන ප්‍රසම්පාදනයන් ඇගයීම සඳහා 05 දෙනෙකුගෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කළ යුතු වුවද, 03 දෙනෙකුගෙන් පමණක් සමන්විත සංස්ථාව විසින් පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් ලංසු ඇගයීම සිදුකර තිබුණි. ණයවර ලිපි විවෘත කිරීමට පෙර පවතින තොග මට්ටම සලකා බැලීමෙන් පසුව හෝ ඒ පිළිබඳ වෛද්‍ය සැපයීම් අංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව හෝ ඇණවුම් කළ යුතු බව වෛද්‍ය සැපයීම් අංශය විසින් දන්වා තිබුණු නමුත් සංස්ථාව එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව වාර්ෂික භාවිතය එන්නත් ඒකක 650 ක් බැවින් මුළු එන්නත් ඒකක ප්‍රමාණයෙන් සියයට 40 ක් හෙවත් එන්නත් ඒකක 1,250 ක් සඳහා පමණක් ණයවර ලිපි විවෘත කළ යුතුව තිබුණු නමුත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය අභිබවා එන්නත් ඒකක 1,563 ක් වෙනුවෙන් රු.මිලියන 68.73 ක ණයවර ලිපි විවෘත කර තිබුණි. 2021 ජූලි 18 දින මිලදී ගෙන තිබුණු එන්නත් ඒකක 1,560 න් එන්නත් ඒකක 1,421 ක් 2022 අගෝස්තු 20 දින වන විට ඉතිරිවී තිබුණු අතර ඒවා 2023 පෙබරවාරි මාසයේදී කල් ඉකුත්වන බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත් ගිවිසුම 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි කර ලියාපදිංචි සහතිකය සංස්ථාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොළඹ 07 ඔසුසැල සඳහා විදුලි සෝපානයක් සවීකිරීම වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.724,936 ක් ගෙවා තිබුණු අතර එය 2021දෙසැම්බර් 31 දින වන විටත් නොනිමි වැඩ යටතේ දැක්වෙන නමුත් වසර 07 ක කාල සීමාවක් ගතවී ඇතත් විදුලි සෝපානය සවිකිරීම් කටයුතු නිමකර නොතිබුණි. | විදුලි සෝපානය සඳහා සැපයුම්කාර ආයතනය විසින් ඉදිරිපත් කර ඇති පරීක්ෂණ වාර්තාවලට අනුව එම විදුලි සෝපානය පිරිවිතරයන්ට අනුකූල නොවන බැවින් එය භාරගත නොහැකි බව, සෝපානය සඳහා "Whole Test Certificate" ඉදිරිපත් කිරීමටද අපොහොසත් වූ බව, පිරිවිතරයන්ට අනුකූල සෝපානයක් සවි කිරීමට සැපයුම්කාර සමාගම වෙත උපදෙස් ලබා දුන් බව, හා ඒ සඳහා එකඟත්වය පළ කළ නමුත් ගැටළුව විසඳීමට සැපයුම්කාර සමාගම කටයුතු කර නොමැති බව. | අත්තිකාරම් ඇපකරය මුදල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |